# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**

**Sabaragamuwa Provincial Department of Education**

**පළමු වාර පරීක්ෂණය 2018** | **11 ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 11**
**First Term Test 2018** | **Grade 11**

**පුරවැසි අධ්‍යාපනය II**
**குடியியற் கல்வி II**
**Citizenship Education**

පැය 2
நேரம் : 2 மணி
***Two hour***

**සැලකිය යුතුයි:**

**(i) පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**

**(ii) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

(01) (i) වර්තමානයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේ ගැටලු දෙකක් සඳහන් කරන්න.

(ii) ජාතික රාජ්‍යය බිහි වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(iii) නූතන රාජ්‍යයන් හි මූලික වශයෙන් දක්නට ලැබෙන ආණ්ඩු ක්‍රම දෙක නම් කරන්න.

(iv) සන්ධීය රාජ්‍යයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(v) ඇමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල දෙකක් ලියන්න.

(vi) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් නම් කරන්න.

(vii) පරිවර්තන ආර්ථිකයන්හි හඳුනාගත හැකි මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(viii) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන කේවල් ක්‍රමයේ ලක්ෂණ දෙකක් ලියන්න.

(ix) යුක්තිය ඇති කිරීම සඳහා ඉතා වැදගත් වන කරුණු දෙකක් දක්වන්න.

(x) 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණය සතු බලතල හා කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (2x10 = 20)

(02) (i) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක නම් කරන්න. (ලකුණු 02 )

(ii) ආණ්ඩුවක් සමන්විත වන ආයතන තුන සඳහන් කරන්න. (ලකුණු 03 )

(iii) (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක දෙකක් නම් කරන්න.

(b) සාමකාමී ජන සමාජයක් ගොඩනැගීමට හේතුවන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

(ලකුණු 05)

(03) (i) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභාවක බලතල වර්ගීකරණය කිරීම සඳහා පදනම් කරගත් ලැයිස්තු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) පළාත් පාලන ආයතනයක නගරාධිපති/සභාපති සතු බලතල හා කාර්යයන් තුනක් දක්වා, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) "සංස්කෘතිය" යන්න පැහැදිලි කිරීමට නිර්වචන ඉදිරිපත් කළ දාර්ශනිකයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ඇති වන වාසි තුනක් දක්වා, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) ඕනෑම අර්ථ ක්‍රමයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) වර්තමානයේ ක්‍රියාත්මක වන නව - ලිබරල්වාදි වෙළෙඳපොල ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ නව සංවර්ධන ප්‍රවණතාවන් වශයෙන් 1994 න් පසු කාල සීමාවෙහි දැකිය හැකි ලක්ෂණ තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වෙනත් විශේෂ නීති වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ජී. මාර්ෂල් විසින් දැක්වූ නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංග තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ගෙන ඇති ප්‍රතිපාදන තුනක් සඳහන් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ හඳුන්වා දුන් ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) 1865 මහ නගර සභා ආඥා පනත යටතේ ඇති කළ මහ නගර සභා තුන සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව) සතු ප්‍රධාන කාර්යයන් තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

# පුරවැසි අධ්‍යාපනය I පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| (01) | 3 | (21) | 1 |
| (02) | 4 | (22) | 4 |
| (03) | 2 | (23) | 2 |
| (04) | 4 | (24) | 4 |
| (05) | 1 | (25) | 3 |
| (06) | 2 | (26) | 4 |
| (07) | 1 | (27) | 2 |
| (08) | 3 | (28) | 3 |
| (09) | 4 | (29) | 3 |
| (10) | 2 | (30) | 2 |
| (11) | 3 | (31) | 3 |
| (12) | 1 | (32) | 2 |
| (13) | 4 | (33) | 4 |
| (14) | 3 | (34) | 1 |
| (15) | 2 | (35) | 3 |
| (16) | 1 | (36) | 1 |
| (17) | 4 | (37) | 4 |
| (18) | 2 | (38) | 3 |
| (19) | 3 | (39) | 4 |
| (20) | 4 | (40) | 4 |

## පුරවැසි අධ්‍යාපනය II

## පිළිතුරු පත්‍රය

(01) (i)

- වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම
- සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම
- වර්තමාන රාජ්‍ය අධික ජනගහනයෙන් සමන්විත වීම
- සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුතාව

(ii)

- පුනරුදය
- විද්‍යාත්මක දැනුම වර්ධනය
- රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
- වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථිකයක් ගොඩනැගීම

(iii)

- පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය
- ජනාධිපති ආණ්ඩුක්‍රමය

(iv)

- ලිඛිත ආණ්ඩු ක්‍රමය
- මධ්‍යම ආණ්ඩුවේ මෙන් ම ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල පැහැදිලිව ව්‍යවස්ථාව තුළ අන්තර්ගත කිරීම
- ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ඉහළ අධිකරණයට පැවරීම
- ඉහළ මන්ත්‍රණ සභාවක් ඇති කිරීම

(v)

- මූල්‍ය කටයුතු
- බදු පැනවීම හා එක් රැස් කිරීම
- ජාතික ආරක්ෂාව සැලසීම
- විදේශ කටයුතු හා විදේශ වෙළඳාම
- ජාතික ආර්ථික සංවර්ධනය

(vi)

- පිහිටීම
- සංක්‍රමණ
- ආක්‍රමණ
- විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිණීම

(vii)

- පෞද්ගලික ව්‍යවසායන් දිරි ගැන්වීම
- ආර්ථික ලිහිල්කරණය
- පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සලසා දීම
- පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම

(viii)

- විධිමත් ක්‍රියාවලියක් යුක්ත වීම
- කණ්ඩායම් ක්‍රියාවලියකි.
- සේව්‍ය සේවක දෙපාර්ශවයකින් යුක්ත වීම
- සාකච්ඡා මේසයේ දී මුණ ගැසී සාකච්ඡා කිරීම
- අන්‍යෝන්‍ය එකඟත්වය මත සිදුවීම
- සේවා කොන්දේසි වේතන හා සම්බන්ධව ක්‍රියාත්මක වේ.
- ඉල්ලීම් වලින් කේවල් කිරීම ආරම්භ වීම
- එකඟත්ව ගිවිසුමකින් කේවල් කිරීම අවසන් වීම

(ix)

- සාධාරණ හා අපක්ෂපාතී විනිශ්චයක් ලබා ගැනීමට තිබෙන අයිතිය
- තමාට ඉදිරිපත්ව ඇති චෝදනා පිළිබඳව දැන ගැනීමට ඇති අයිතිය
- තමා වෙනුවෙන් අධිකරණය ඉදිරියේ තමාම පෙනී සිටීමට හෝ නීතිඥයෙකු මගින් කරුණු කීමට ඇති අයිතිය

(x)

- නීති විවරණය කිරීම
- නඩු විනිශ්චය කිරීම /යුක්තිය පසිඳලීම
- පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරදීම
- නීති සම්පාදනය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම
- පළාත් සභාව, පළාත් පාලන ආයතන හා මධ්‍යම ආණ්ඩුව අතර ඇතිවන ගැටුම් විසඳීම

(2) (i)

- එංගලන්තය
- ප්‍රංශය

(ii)

- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය

(iii) (a)

- නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම
- නීතියේ ආධිපත්‍ය පැවතීම
- අධිකරණයේ ස්වාධීනත්වය
- දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් සිටීම
- යහපත් ආර්ථික මට්ටමක් පැවතීම
- නිදහස් හා අපක්ෂපාතී ජන මාධ්‍යයක් පැවතීම
- ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්ම

(b)

- බහුතර මතයට අනුව කටයුතු කිරීම
- නීතියේ ආධිපත්‍යය පැවතීම
- අධිකරණයේ ස්වාධීනත්වය
- සුළුතරයේ අදහස්වලට ගරු කිරීම
- සාකච්ඡා මගින් තීරණවලට එළඹීම
- පුරවැසියන්ට තම අදහස් සාමකාමීව ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම
- නිදහස සමනාත්මතාව හා සමාන අයිතිවාසිකම් හිමි වීම.

(03) (i)

- I වන ලැයිස්තුව(පළාත් සභා ලැයිස්තුව)
- II වන ලැයිස්තුව (සංවෘත ලැයිස්තුව)
- III වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව)

(ii)

- ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා

(iii)

- අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ක්‍රියා කිරීම
- සභාව කැඳවීම, මුලසුන ගැනීම හා සභාව කල් තැබීම
- අය - වැය ලේඛනය සකස් කිරීම සහ ඒ සඳහා සභාවෙන් අනුමැතිය ලබා ගැනීම
- තම බල ප්‍රදේශයට අදාළ සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාවට නැංවීම
- මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව සමග සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගෙන යාම
- මහජන උපයෝගීතා සේවාවන් සැපයීමට මුල් වීම

(04) (i)

- ටී. බී. ටයිලර්
- චාර්ල්ස් ඒ එල්වුඩ්
- ඊ. ටී. හීලර්

(ii)

- විවිධ ජන වර්ග, විවිධ ආගමික විශ්වාස දරණ, විවිධ භාෂා කථා කරන පුද්ගලයින් එකට ජීවත් වීම
- ඉහත විවිධත්වය නිසා ඇති වී තිබෙන ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත් විරිත් ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම
- එක ජන කොටසක වුවත්, ප්‍රාදේශීය විවිධත්වය දැකිය හැකි වීම
- වර්තමානය වන විට ලෝකයේ රටවල් ජාතීන් වශයෙන් තම දේශ සීමාවලින් ඔබ්බට ගොස් විවිධ ජාතීන් සමඟ සම්මිශ්‍ර වී බහු සංස්කෘතික සමාජ ගොඩ නැගීම
- ගෝලීයකරණය, සන්නිවේදන තාක්ෂණයේ දියුණුව හා සංචාරක ව්‍යාපාරය දියුණුවීම හේතුවෙන් ලෝකයම එකම විශ්ව ගම්මානයක් බවට පත්වී සංස්කෘතික සම්මිශ්‍රණය වීම ඉතා වේගයෙන් සිදු වීම

(iii)

- ගැටුම් අවම වේ.
- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
- අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ.
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.
- රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියෙකුම නොපිරිහෙලා කටයුතු කිරීම හා එය ජාතික යුතුකමක් සේ සලකා කටයුතු කිරීමට පෙළඹේ.
- අන්‍ය ආගම් හෝ සංස්කෘතීන්ට ගරු කිරීමට හුරු වේ.
- එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වේ.

(05) (i)

- කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

(ii)

- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම
- වෙළෙඳ පොළ තත්ත්ව මත මිල තීරණය වීම
- දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයන් දිරි ගැන්වීම
- සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීම

- පෞද්ගලික දේපළ අයිතියට ඉඩ දීම
- ආර්ථික කටයුතුවලට රාජ්‍ය අංශයේ මැදිහත් වීම සීමා වීම
- වෙළඳපොළ බාධා, ආනයන අපනයන බදු ආදිය ඉවත් කිරීම
- පාලන නීති රීති සීමා අවම කිරීම
- විනිමය අනුපාතික පාලනයකින් තොරව නිදහසේ තීරණය වීමට ඉඩ සැලසීම

(iii)

- විවෘත ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් ක්‍රියාත්මක කිරීම
- පෞද්ගලික ව්‍යවසායන්ට බදු සහන ලබාදීම
- යම් රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම
- යටිතල පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික අංශය දායක කරගැනීම
- රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම
- ප්‍රතිපත්ති සම්පාදනයේ දී ජාත්‍යන්තර උපදෙස් ලබාගැනීම ආදි වර්තමානයට ගැළපෙන පිළිතුරු තුනක්

(06) (i)

- උඩරට නීතිය
- තේසවලාමේ නීතිය
- මුස්ලිම් නීතිය

(ii)

- සෑම කෙනෙකුම රටේ නීතියට යටත් වීම
- ස්වාධීන අධිකරණයක් මගින් සෑම දෙනාට ම සර්ව සාධාරණ හා සමානව නීතිය ක්‍රියාත්මක කිරීම.
- අපක්ෂපාතී, නිශ්චිත, සාධාරණ හා යුක්ති සහගත පොදු නීති පද්ධතියක් තිබීම

(iii)

- විනිශ්චයකරුවන් පත් කිරීම
- විනිශ්චයකරුවන් ඉවත් කිරීම
- විනිශ්චයකරුවන්ගේ වැටුප් ගෙවීමේ ක්‍රමය
- අධිකරණ කටයුතුවලට බලපෑම් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම
- වෙනත් තනතුරු පිළිගැනීම හෝ විශ්‍රාම ගිය පසුව ද වෙනත් රැකියාවක නිරත නොවිය යුතු බව
- අධිකරණ තීන්දු විවේචනය නොකිරීම
- අධිකරණ සේවා කොමිෂම පිහිටුවීම

(07) (i)

- මහජන මන්ත්‍රී මණ්ඩලය (නියෝජිත මන්ත්‍රී මණ්ඩලය)
- සෙනෙට් සභාව (උත්තර මන්ත්‍රී මණ්ඩලය)

(ii)

- කොළඹ, මහනුවර, ගාල්ල

(iii)

- නීති පැනවීම
- විධායකයට අවශ්‍ය බහුතරය සැපයීම
- විධායකය පාලනය
- අය - වැය පාලනය
- ප්‍රශ්න ඇසීම
- දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම
- ආණ්ඩුවේ ක්‍රියා මාර්ග සාධාරණව විවේචනය කිරීම